# දඹදෙණි රාජධානියේ ස්ථාවරත්වය උදෙසා බෝසත් විජයබාහු කුමරුගේ ප්‍රතිසංස්කරණ භූමිකාව

## On the Role of the Reforms of Prince Bosath Vijayabahu for Stabilising the Dambadeniya Kingdom

හාසිත චාමිකර ගුණසිංහ

**Absract**

Dambadeniya was the third kingdom in Sri Lanka. After the death of its founding ruler, King Vijayabahu III (1232-1236), the father and son, Parakramabahu II (1236-1270) and Vijayabahu IV (1270-1272), succeeded to the throne, respectively, and ruled Dambadeniya. This study aims to investigate the role of Prince BÈath Vijayabahu, also known as Vijayabahu IV, in stabilising the Dambadeniya Kingdom. Historical methodology was applied, with special reference to primary sources. According to the annals, when Prince BÈath Vijayabahu was selected for the throne, King Parakramabahu II gave a list of tasks to perform. It includes the renovation of the Ruwanmeli Dagaba, the restoration of Polonnaruwa, the enshrinement of the Tooth Relic and the Bowl Relic in Polonnaruwa, the performance of the Abhisheka ceremony in Polonnaruwa, and the hÈting of the Upasampada ceremony in Dahasthota. Prince BÈath Vijayabahu successfully carried out these tasks by devising a practical plan and enlisting the support of other members of the royal family.

**Keywords:** Dambadeniya Kingdom, Parakramabahu II, BÈath Vijayabahu, Vijayabahu IV

## හැඳින්වීම

පොළොන්නරු රාජ්‍ය කළ පරාක්‍රම පාණ්ඩ්‍ය (1212-1215) සමයේ දී, 24,000ක දමිළ සේනාවක් සමඟ වර්ෂ 1215දී ලක්දිවට පැමිණි කාලිංග මාඝ නමැති ආක්‍රමණිකයා විසින් විශාල සංහාරයක් සිදුකොට රජරට ප්‍රදේශය අත්පත් කරගන්නා ලදැයි වංසකථාවල සඳහන් වේ. රාජධානියේ සෑම අංශයක්ම පාහේ පීඩාවට පත්කළ මෙකී ආක්‍රමණයේ ප්‍රතිඵලය වූයේ පොළොන්නරු රාජධානිය බිඳවැටීමයි. මේ නිසා භික්ෂූන්, ප්‍රභූන් සහ සාමාන්‍ය ජනතාවට සිදුවූයේ රැකවරණය පතා රුහුණු රට හා මායා රටට පලායෑමටයි (මහාවංසය ද්විතීය භාගය, 2015:80 පරි. 52-80).

මාඝගේ ආක්‍රමණය හේතුවෙන් ඇති වූ ආරාජික සමයේ ප්‍රාදේශීය බලවතුන් කිහිපදෙනකු ස්වාධීන රාජ්‍ය පවත්වාග නිමින්, මහජනතාවට ආරක්ෂාව සහ බුදුසසුනට අනුග්‍රහය සැපයීමට සමත් ව තිබේ. මෙයින් ප්‍රධාන බලවතුන් තිදෙනා වූයේ සුබපබ්බත හෙවත් යාපහුවේ සිටි සුබ සෙනෙවියා, රුහුණේ ගෝවින්ද පර්වතයේ සිටි බුවනෙකබාහු ආදිපාද හා මණිමේඛල හෙවත් මිණිපේ ගංගාද්‍රෝණි පර්වතයේ සිටි සංඛ සෙනෙවියා ය. මෙකී කාලසීමාවේ ම වන්නි ප්‍රදේශ පාලනය කළ වන්නිරාජවරු අතරින් කැපී පෙනෙන ලෙස ඉදිරියට පැමිණි වන්නි විජයබාහු මායා දේශයේ අධිපතියා බවට පත් ව, දඹදෙණියේ තම පාලන මධ්‍යස්ථානය පිහිටුවා ගැනීමට සමත් විය. තුන්වැනි විජයබාහු (1232-1236) නමින් ප්‍රකට හෙතෙම නව රාජධානියක මෙන් ම නව රාජ පරම්පරාවක පුරෝගාමියා වශයෙන් සැලකේ (මහාවංසය ද්විතීය භාගය, 2015:81 පරි. 01-16 ගාථා).

තුන්වන විජයබාහු රජතුමා ඇවෑමෙන් ඔහුගේ වැඩිමහල් පුත් දෙවන පරාක්‍රමබාහු (1236-1270) සිහසුනට පත්විය. කාලිංග මාඝ පරාජයට පත් කරන ලද දෙවන පරාක්‍රමබාහු රජතුමා, ලක්දිව ආක්‍රමණය කළ චන්ද්‍රභානු නම් ජාවක ආක්‍රමණිකයා පරාජය කිරීමට ද සමත් විය. සිහසුනට යෝග්‍ය අනුප්‍රාප්තිකයකු තෝරාග ැනීමට හෙතෙම උත්සුක වන්නේ මෙකී කාලසීමාවේ දී ය.

## බෝසත් විජයබාහු කුමරු සිහසුන සඳහා තෝරාගැනීම

දෙවන පරාක්‍රමබාහු රජතුමා තමන් ඇවෑමෙන් සිහසුනට සුදුස්සෙකු තෝරාගැනීම මහාසම්මතයෙන් සිදු කළ අන්දම පූජාවලියේ සහ මහාවංසයේ දීර්ඝව විස්තර කෙරේ. එම අවස්ථාවට විජයබාහු, බුවනෙකබාහු, ත්‍රිභුවනමල්ල (තිලෝකමල්ල), පරාක්‍රමබාහු සහ ජයබාහු යන පුත් කුමාරවරු පස්දෙනා සහ රජතුමාගේ බෑණා වූ වීරබාහු කුමරු පැමිණ සිටි බව සඳහන් වේ. කුමාවරුන් හයදෙනා වෙත අවවාද කරමින් සමඟියෙන් රාජ්‍ය කළ යුතු බව පහදා දුන් රජතුමා ඒ සඳහා උපමාවට ගත්තේ දඹදිව සාගර රජතුමාගේ පුත්‍රයන් 60,000 සමඟියෙන් රාජ්‍ය කිරීම පිළිබඳ කථාපුවත යි. මීට අමතර ව අවජාත, අනුජාත සහ අතිජාත යනුවෙන් පුත්‍රයන් වර්ග තුනක් ඇති බවත්, එයින් අතිජාත පුත්‍රයන් බවට පත්විය යුතු බවත් රජතුමාගේ අවවාදය විය. අනතුරු ව රජතුමා මෙම අවස්ථාව සඳහා සහභාගි වී සිටි භික්ෂූන් හා මහජනතාවගෙන් තමන් ඇවෑමෙන් සිහසුනට සුදුසු පුද්ගලයා නම් කරන්නැයි ඉල්ලා සිටි බව සඳහන් වේ. එහි දී භික්ෂූන් විසින් සිහසුනට යෝග්‍ය යැයි ප්‍රකාශ කරන ලද්දේ රජතුමාගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර විජයබාහු කුමරුන් ය. කුමරු තුළ පැවති බෝසත් ගතිගුණ සහ සිහසුනට කුමරු යෝග්‍ය වූ අන්දම පිළිබඳ භික්ෂූන් කළ දීර්ඝ විවරණයේ එන එක් වැදගත් ප්‍රකාශයක් හඳුනාගත හැකි ය;

...අරාජිතයෙහි ගැති දස්ව ගිය සංඝයාගේ බන්ධූන් හා දුඃඛිත ජනයන්ට සුවහස් ගණන් රන් රුවන් දී සිය ගණන් ගළවා අළහ... (පූජාවලිය, 2009:797-798)

මෙයින් කියැවෙන්නේ අරාජික කාලසීමාවේ දී භික්ෂූන්ගේ ඥාතීන් මෙන් ම තවත් පිරිස් ණය බරින් දාස භාවයට පත් ව සිටි බව යි. ඔවුන් නිදහස් මිනිසුන් බවට පත්කරවීමේ වැඩපිළිවෙළක් විජයබාහු කුමරු ඒ වන විටත් ආරම්භ කර තිබූ බව මෙමගින් පැහැදිලි වේ. මීට අමතර ව කුඩා දරුවන්ගේ පටන් වැඩිහිටියන් දක්වා කුමරු ප්‍රිය කිරීමත්, කුමරු යටතේ පාලනය වීමට ඔවුන් කැමැත්තෙන් පසුවීමත්, වන්නි පාලකයන් දෙවැනි පරාක්‍රමබාහු

හමුවීමට බිය වූ නමුත් විජයබාහු කුමරු හමුවීමට ප්‍රිය වූ බවත් සඳහන් වන හෙයින් සෑම කණ්ඩායමක් සමඟම ඒ වන විටත් කුමරු යහපත් සබඳතා පැවැත් වූ බව පිළිගත හැකි ය.

භික්ෂූන් විසින් සිහසුන සඳහා විජයබාහු කුමරු තෝරාග ැනීමෙන් පසු ව කුමරු තමා සමීපයට කැඳවා දළදාව සහ පාත්‍රධාතුව සහිතව රාජ්‍යය පවරා දුන් දෙවන පරාක්‍රමබාහු රජතුමා තමන්ට ඉටු කරගත නොහැකි වූ පහත කාර්යය ඉටු කිරීම සඳහා උපදෙස් ලබාදුන් බව වංසකථා සඳහන් කරයි;

- රුවන්මැලිසෑය පිළිසකර කරවා කොත් පැළඳවීම
- පොළොන්නරුව පිළිසකර කරවීම
- පොළොන්නරු දළදා මාලිගාවේ දළදාව සහ පාත්‍රා ධාතුව තැන්පත් කිරීම
- පොළොන්නරුවේ අභිෂේක මංගල්‍යයක් පැවැත්වීම
- මහවැලි ගඟේ දහස්තොට උපසම්පදා මංගල්‍යයක් පැවැත්වීම

බෝසත් විජයබාහු කුමරුගේ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ආරම්භ වන්නේ පියරජතුමාගේ ඉහත ඉල්ලීම් පාදක කරගනිමිනි (පූජාවලිය, 2009:799; මහාවංසය ද්විතීය භාගය, 2015:87 පරි. 67-74 ගාථා).

මෙකී කටයුතු දඹදෙණියේ දේශපාලන ස්ථාවරත්වය තහවුරු කිරීමටත්, ශාසනික ප්‍රබෝධය ඇති කිරීමටත් ඉවහල් වන සුවිශේෂී කටයුතු බව හඳුනාගත හැකි ය. වසර ගණනක් රාජ්‍ය පාලනය කළ ද දෙවැනි පරාක්‍රමබාහු රජතුමාට මෙම කටයුතු ඉටුකරගත නොහැකිවීම ද මෙහි දී සැලකිය යුත්තකි.

**බෝසත් විජයබාහු කුමරුගේ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය සඳහා පසුබිම සැකසීම**

පියරජතුමා විසින් තමන්ට පවරන ලද කටයුතු ඉටු කරලීමට පෙරාතුව බෝසත් විජයබාහු කුමරු සිදු කළ ප්‍රථම

කටයුත්ත වූයේ ඊට ඥාති සොයුරු වීරබාහු කුමරුගේ සහයෝගය ලබාගැනීම යි. කුඩා කල පටන් දෙදෙනා අතර පැවති සමීප මිත්‍රත්වය මෙන් ම දක්ෂ රණශූරයකු වශයෙන් වීරබාහු කුමරු ප්‍රකටව සිටීම මෙම තෝරාගැනීම සඳහා හේතුවන්නට ඇත (පූජාවලිය, 2009:800; මහාවංසය ද්විතීය භාගය, 2015:88 පරි. 04-09 ගාථා).

පියරජතුමා පැවරූ කටයුතු ඉටු කිරීමට පෙරාතුව රාජධානියේ ස්ථාවරත්වය වෙනුවෙන් සිදු කළ යුතු අත්‍යවශ්‍ය කටයුතු කිහිපයක් බෝසත් විජයබාහු ඒ වන විටත් හඳුනාගෙන තිබූ බව පෙනේ. එයින් පළමුවන කටයුත්ත වූයේ දඹදෙණි දළදා මාලිගාව ප්‍රතිසංස්කරණය කරවා දළදා පුද පූජා වඩාත් ඉහළින් පැවැත්වීමට කටයුතු සම්පාදනය කිරීම යි (පූජාවලිය, 2009:800; මහාවංසය ද්විතීය භාගය, 2015:88 පරි. 10-16 ගාථා). සිහසුන් උරුමකරුවා ලෙස රාජත්වයේ සංකේතය වූ දළදා වහන්සේට නිසි ගෞරවය පළකිරීම මෙහි දී කුමරුගේ අපේක්ෂාව වූවා විය යුතු ය.

දෙවනුව රාජ්‍යයේ කටයුතු උදෙසා තම සොයුරන් සිවුදෙනාගේ සහාය ලබාගනිමින්, ඔවුන්ට නිසි වගකීම් පැවරීමට බෝසත් විජයබාහු කටයුතු කර තිබේ. ඒ යටතේ සහෝදර කුමාරවරුන්ට වගකීම් පවරා දී ඇත්තේ පහත පරිද්දෙනි;

- පරාක්‍රමබාහු කුමරු සහ ජයබාහු කුමරු - පියරජතුමා සමීපයේ දඹදෙණියේ රැඳවීම
- ත්‍රිභුවනමල්ල කුමරු - දකුණු ප්‍රදේශයේ ආරක්ෂාව සඳහා වත්තල රැඳවීම
- බුවනෙකබාහු කුමරු - උතුරු ප්‍රදේශයේ ආරක්ෂාව සඳහා යාපහුවේ රැඳවීම

(පූජාවලිය, 2009:800; මහාවංසය ද්විතීය භාගය, 2015:88 පරි. 17-26 ගාථා).

සහෝදර කුමාරවරුන්ට වගකීම් පවරාදීමෙන් අනතුරු

ව රාජධානියේ එක් එක් ස්ථානවලට පිටත්ව රාජ්‍යය ස්ථාවර කිරීමෙන් අනතුරු ව පොළොන්නරුව බලා පිටත්වීම බෝසත් විජයබාහුගේ අපේක්ෂාව වී තිබේ. ඒ වන විටත් උතුරු ප්‍රදේශයේ චන්ද්‍රභානු ඇතුලු පිරිස රැඳී සිටීම හේතුවෙන් රාජධානියේ අභ්‍යන්තර ආරක්ෂාව තර කිරීම කුමරුගේ සැලැස්ම වන්නට ඇතැයි හඳුනාගත හැකි ය.

මෙම අවස්ථාවේ දී දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ නියමය පරිදි පොළොන්නරුව ගොඩනැගීමේ කටයුත්ත සඳහා බෝසත් විජයබාහු සමඟ පිටත්වීමට ඇමතිවරු, සෙන්පතිවරු, මහජනතාව සහ ඔවුන්ගේ අඹුදරුවන් ඇතුලු මහ පිරිසක් සූදානම් වූ බව වංසකථා සඳහන් කරයි (පූජාවලිය, 2009:800-801; මහාවංසය ද්විතීය භාගය, 2015:88 පරි. 04-09 ගාථා). එහෙත් ඒ සඳහා කුසීත වූ පිරිසක් ද සිටි බව වාර්තා වේ. මේ පිළිබඳ මහාචාර්ය අමරදාස ලියනගමගේ සඳහන් කරන්නේ චිරාත් කාලයක් අචල භක්ති ප්‍රණාමයට පත් ව තිබූ රජරට පැරණි නගර සහ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය සඳහා මහජනතාව තුළ උනන්දුවක් පැවතියා සේම, ඒ වන විට රජරට ප්‍රදේශයේ ජන ජීවිතයට හිතකර පරිසරයක් බොහෝ කලක පටන් නොපැවති හෙයින් එහි පිටත්වීමට ඇතැමුන් තුළ අකමැත්තක් පවතින්නට ඇති බවයි (ලියනගමගේ, 1989:238). කුමරු සමඟ මහා පිරිසක් තම නිවෙස් පවා හැරදමමින් පිටත්ව යාමට සූදානම් වීමත් සමඟ දෙවන පරාක්‍රමබාහු රජතුමා සිදුවූයේ අත්‍යවශ්‍ය පිරිස් හැරෙන්නට අනෙක් සියලුදෙනා නවතා ගැනීමට බව වංසකථාවල සඳහන් වේ (පූජාවලිය, 2009:800-801; මහාවංසය ද්විතීය භාගය, 2015:88 පරි. 04-09 ගාථා).

පොළොන්නරුවට පිටත්වීමට පෙරාතුව බෝසත් විජයබාහු විසින් රාජධානියේ ප්‍රධාන ස්ථාන කිහිපයකට පිටත්ව එම ප්‍රදේශවල ආරක්ෂාව තහවුරු කිරීමත්, විහාර කර්මාන්ත සිදු කර එහි නඩත්තුවට අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමත් සිදු කරනු ලැබ තිබේ. එම ස්ථාන බොහොමයක් යුද්ධෝපක්‍රමික අතින් වැදගත් ස්ථාන වන හෙයින් එහි වටිනාකම හඳුනාගත් කුමරු ඒ සඳහා

අවශ්‍ය කටයුතු සැලසීමත්, එම ප්‍රදේශවල ජනතාවගේ සහයෝගය ලබාගැනීමත් අරමුණු කොටගෙන මෙම චාරිකාව සිදු කරන්නට ඇතැයි අමරදාස ලියනගමගේ අදහස් පළ කරයි (ලියනගමගේ, 1989:238-239). ඒ අතරින් ගම්පොළ, කුරුණෑගල හා යාපහුව පසුකලෙක රාජධානි බවට පත් වූ හෙයින් එකී ස්ථානවල ඇති වැදගත්කම කුමරු මැනවින් හඳුනාගෙන තිබෙන්නට ඇතැයි පිළිගත හැකි ය.

බෝසත් විජයබාහු කුමරු තම පිරිස සමග පිටත් වූ ස්ථාන පිළිවෙලින් මෙසේ ය;

- වාගිරිගල (වාකිරිගල)
- ශ්‍රී පාදස්ථානය
- ගඟසිරිපුර (ගම්පොළ)
- සිඳුරුවාණ වල්ගම්පාය
- හස්තිගිරිපුරය (කුරුණෑගල)
- යාපහුව

කුමරු පළමුව පැමිණෙන්නේ වාගිරිගලට ය. පොළොන්නරුවේ මහා විජයබාහු රජතුමා (1055-1110) ආරක්ෂිත ස්ථානයක් වශයෙන් උපයෝගී කොටගත් වාගිරිගල අතිශය වැදගත් ස්ථානයක් වශයෙන් හඳුනාගැනේ. එහි ප්‍රාකාර බඳවා රජමාලිගයක් ඉදි කර වූ බෝසත් විජයබාහු ආපදා අවස්ථාවක දී ප්‍රයෝජනයට ගැනීම සඳහා පියරජතුමා ලබා දුන් ධනය එහි නිධන් කරන ලදැයි මහාවංසයේ සඳහන් වේ. එම පර්වතයේ විහාරයක් ඉදි කරවා මහානේත්‍රප්‍රාසාද මූලයේ අධිපති හිමියන්ට පූජා කිරීමට ද කුමරු කටයුතු කර තිබේ (පූජාවලිය, 2009:801; මහාවංසය ද්විතීය භාගය, 2015: 58 පරි. 31-32 ගාථා, 61 පරි. 38-39 ගාථා, 88 පරි. 43-47 ගාථා).

දෙවනුව ශ්‍රී පාද වන්දනාවේ පිටත් වූ කුමරු අතින් එහි නඩත්තුව සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය වන්නට ඇතැයි

විශ්වාස කළ හැකි ය. එතැනින් කුමරු ඇතුලු පිරිස පැමිණෙන්නේ ගඟසිරිපුරයට ය. පොළොන්නරු යුගයේ ශ්‍රී පාදස්ථානය දක්වා මාර්ගය වැටී තිබුණේ ගඟසිරිපුරය හරහා බව කියැවේ. එහි පිහිටි නියම්ගම්පාය විහාරය ප්‍රතිසංස්කරණය කරවන ලද කුමරු විසින් විහාරයේ නඩත්තුව උදෙසා ගම්වර පූජා කරන ලදී. පසු ව සිඳුරුවාණට පැමිණි කුමරු වල්ගම්පාය විහාරය ප්‍රතිසංස්කරණය කරවා පියරජතුමා නමින් 'අභයරාජ පිරිවෙන' එහි ඉදි කරවා තිබේ. එම පිරිවෙනේ නඩත්තුව උදෙසා ගම්වර පූජා කිරීම ද කුමරු අතින් සිදුවිය (පූජාවලිය, 2009:801; මහාවංසය ද්විතීය භාගය, 2015:88 පරි. 48-52 ගාථා).

එතැනින් හස්තිගිරිපුරය පැමිණි කුමරු පළමුව සිදු කර ඇත්තේ සුළුපියා වූ බුවනෙකබාහු කුමරු එහි ඉදි කළ විහාරයේ නඩත්තුව වෙනුවෙන් ගම්වර පූජාකොට කැපකරුවන් පත් කිරීමයි. අනතුරු ව එම විහාර පරිශ්‍රයේ පිහිටි සුළුපියා ආදාහනය කළ ස්ථානය බලා අනිත්‍ය මෙනෙහි කළ කුමරු එම ස්ථානයේ තුන්මහල් පිළිමගෙයක් කරවා, සර්වාභරණයෙන් සැරසූ සුළුපියාගේ ප්‍රතිමාවක් තැන්පත් කර තිබේ. මීට අමතර ව සුළුපියා නමින් එහි 'බුවනෙකබාහු පිරිවෙන' ඉදි කළ බව සඳහන් වේ. අනතුරු ව හස්තිගිරි නගරයේ ප්‍රාකාර බඳවා ආරක්ෂාව තහවුරු කළ කුමරු එහි කටයුතු සඳහා බදලගොඩ නුවර ජනතාවට භාර කළ බව පූජාවලිය සහ මහාවංසයේ සඳහන් වේ (පූජාවලිය, 2009:801; මහාවංසය ද්විතීය භාගය, 2015:88 පරි. 53-60 ගාථා). පොළොන්නරු යුගයේ දී බදලගොඩ ප්‍රාදේශීය රාජ්‍යයක් වශයෙන් පැවති බවට සාධක පවතී (Epigraphia Zeylanica Vol. IV, 1994:78-79). පසු ව යාපහුවට පැමිණි විජයබාහු කුමරු සහ වීරබාහු කුමරු චන්ද්‍රභානුගේ දෙවැනි ආක්‍රමණයට පරාජය කිරීමට සමත්වූහ (පූජාවලිය, 2009:802; මහාවංසය ද්විතීය භාගය, 2015:88 පරි. 61-76 ගාථා).

ඒ දක්වා බෝසත් විජයබාහුගේ වැඩපිළිවෙළ සමාලෝචනය කරන අමරදාස ලියනගමගේ සඳහන් කරන්නේ වංසකථාවල වර්ණනා මුඛයෙන් දැක්වෙන සිල්වත්කම සහ

ත්‍යාගශීලී භාවය ආදී ගුණාංගවලින් බෝසත් විජයබාහු යුක්ත වූවා සේම චන්ද්‍රභානුගේ ආක්‍රමණයට සාර්ථකව මුහුණදීම සඳහා යුද්ධ සංවිධානය ගොඩනඟා තිබීම හේතුවෙන් කාර්යශූරත්වයක් සහිත පුද්ගලයකු ද වූ බවයි (ලියනගමගේ, 1989:238). චන්ද්‍රභානු පැරදවීමත් සමඟ පවුරු බඳවා යාපහුගල මත මාලිගයක් ඉදි කර වූ බෝසත් විජයබාහු විසින් එහි කටයුතු බුවනෙකබාහු කුමරුට භාර කරනු ලැබ තිබේ. මෙම කාලසීමාවේ දී යාපහු නුවර ආසන්නයේ වැඩසිටි භික්ෂූන් වහන්සේලාගේ නඩත්තුව උදෙසා ප්‍රත්‍ය සම්පාදනයට ද බෝසත් විජයබාහු කටයුතු කළ බව සඳහන් වේ (පූජාවලිය, 2009:802; මහාවංසය ද්විතීය භාගය, 2015:88 පරි. 77-79 ගාථා).

## අනුරාධපුර ප්‍රතිසංස්කරණය

මෙතෙක් රාජධානියේ ස්ථාවරත්වය කාර්ය සංවිධානය කළ බෝසත් විජයබාහුගේ අවධානය මීළඟට යොමුවන්නේ රජරට ප්‍රතිසංස්කරණය කිරීමට ය. ඒ වන විට උතුරු ප්‍රදේශයේ රැඳී සිටි චන්ද්‍රභානු පරාජයට පත්කර තිබීම මෙතෙක් රජරට ප්‍රතිසංස්කරණය පමාකිරීමට හේතුවක් වන්නට ඇත. බෝසත් විජයබාහු පළමුව පැමිණෙන්නේ පුරාණ ශ්‍රී ලංකාවේ මූල නගරය මෙන් ම බෞද්ධයන්ගේ ශුද්ධ නගරය වූ අනුරාධපුරයට යි. එනම් පියරජතුමා විසින් පවරා දෙන ලද කාර්යය ලැයිස්තුවේ පළමුවැනි කාර්යය ඉටුකිරීමට ය. වනයෙන් වැසී තිබූ ශ්‍රී මහා බෝධිය, රුවන්මැලි සෑය, දෙනානක (ජේතවනය) තඹරුප් (ථූපාරාම) හා ලෝවාමහාපාය යනාදී සිද්ධස්ථාන පිරිසිදු කරවා එහි ප්‍රතිසංස්කරණ කටයුතු කුමරු ආරම්භ කළ බව පූජාවලිය සහ මහාවංසයේ සඳහන් වේ. එම කටයුතු අධීක්ෂණය කරන ලද්දේ සේනානාථ හෙවත් සෙනෙවිරත් පිරිවෙන්පති හිමියන් ය. උන්වහන්සේලාගේ නඩත්තුව වෙනුවෙන් ප්‍රත්‍ය පහසුකම් සැලසීමට ද කුමරු කටයුතු කර තිබේ (පූජාවලිය, 2009:802; මහාවංසය ද්විතීය භාගය, 2015:88 පරි. 80-87 ගාථා).

අනුරාධපුරයේ රැඳී සිටි කාලසීමාවේ කුමරු බැහැදැකීමට මහවන්නීන් පිරිසක් පැමිණි බව වංසකථා සඳහන් කරයි. ඊට

අනුව පෙනීයන්නේ දෙවන පරාක්‍රමබාහු රජතුමා දැකීමට පවා බිය වූ ඔවුන් පුදපඬුරු රැගෙන කුමරු බැහැදුටු බවයි. කුමරු විසින් ඔවුන්ට සෙමර, සේසත්, කිරුළු ආදී කකුධ භාණ්ඩ ලබාදුන් අතර මීට පෙර යුද්ධවලදී අල්ලාගෙන සිටි ඔවුන්ගේ අඹුදරුවන් නැවත ඔවුන්ට පාවාදීමට කුමරු කටයුතු කළ බව සඳහන් වේ (පූජාවලිය, 2009:802; මහාවංසය ද්විතීය භාගය, 2015:88 පරි. 88-89 ගාථා). මෙයින් හෙළිවන වැදගත් කරුණක් නම් දෙවැනි පරාක්‍රමබාහු රජතුමා සොයුරු බුවනෙකබාහු උපරාජයා ලවා වන්නිවරු අවනත කරගැනීමේ කාර්යයේ දී උපායක් වශයෙන් මහවන්නිවරුන්ගේ අඹුදරුවන් ප්‍රාණඇපකරුවන් වශයෙන් දඹදෙණියට ගෙනඑන්නට ඇති බව යි. මහවන්නිවරුන්ගේ සිත් දිනාගත් විජයබාහු කුමරු විසින් අනුරාධපුර නගරයේ ආරක්ෂාව ඔවුන්ට භාර කරන ලදි. මේ පිළිබඳ අමරදාස ලියනගමගේ සඳහන් කරන්නේ රජ කුමරකු නවතා අනුරාධපුරයේ පාලනය ගෙනයෑමට තරම් හැකියාවක් ඒ වන විට නොපැවති හෙයින්, එම ප්‍රදේශයේ වන්නි නායකයන්ගේ පක්ෂපාතීත්වය දිනාගනිමින් ඔවුන්ටම පාලනය ගෙනයෑමට භාරකිරීම විජයබාහු කුමරුගේ ප්‍රඥාගෝචර ක්‍රියාවක් බවයි (ලියනගමගේ, 1989:249-250).

## පොළොන්නරුව ප්‍රතිසංස්කරණය

දඹදෙණි අගනුවරින් පටන් ගත් බෝසත් විජයබාහුගේ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ කූටප්‍රාප්තිය පොළොන්නරුව ප්‍රතිසංස්කරණය කිරීමයි. වීරබාහු කුමරු සමඟ පොළොන්නරුවට පිටත් වූ බෝසත් විජයබාහු විසින් පළමුව සිදු කරන ලද්දේ ඒ වන විට පොළොන්නරුවේ පැවති තත්ත්වය පිළිබඳ තක්සේරුවක් කිරීම යි. විනාශ වී ගිය වෙහෙර විහාර, පාළුවට ගොස් තිබූ කෙත්වතු සහ කැඩී බිඳී තිබූ වැව් අමුණු සහිත පොළොන්නරුවේ තත්ත්වය පිළිබඳ පියරජතුමා වෙත කුමරු දැනුම්දීමත් සමඟ ප්‍රතිසංස්කරණ කටයුතු උදෙසා ශිල්පීන් සහ ආයුධ සහිත පිරිසක් එවන ලදැයි සඳහන් වේ (පූජාවලිය, 2009:802-803; මහාවංසය ද්විතීය භාගය, 2015:88 පරි. 90-110 ගාථා).

පූජාවලියේ සඳහන් තොරතුරුවලට අනුව වර්ෂ 1262දී පමණ මෙම කණ්ඩායමේ සහයෝගය ඇතිව බෝසත් විජයබාහු පොළොන්නරුවේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළ බව පෙනේ. ඒ යටතේ කුමරු අනුගමනය කළ වැඩපිළිවෙල මෙසේ ය;

''...පොළොන්නරුවෙහි නොඑක් කර්මාන්ත කරවන්නාහු, පළමුකොට මහ සැඟෑ ඇළ ආදී නැසී නැසී ගිය වැවු කර්මාන්ත කොට, අමුණු කර්මාන්ත නිමවා, මහවෙල් හෙළිකරවා, කෙත් කුඹුරු ඇතිකොට, ගොයම් කරවා රට බතින් සමෘද්ධ කරවා, ජනගහන කරවා, ඒ දෙවනුව නුවර වාසල් පවුරු වීථි පතැස් උයන් පොකුණු යනාදී කර්මාන්ත පෙර සේම කරවා තුන්වනුව ලංකාතිලකාදී වෙහෙර සසුන් කරවා, ලක්ෂ ගණන් මනුෂ්‍යයන්ගෙන් මහ ජනගහන කරවා....'' (පූජාවලිය, 2009:803).

මින් පැහැදිලි වන වැදගත් කරුණක් නම් එක්වර මහා ජනකායක් පොළොන්නරුවට ගෙන්වාගෙන දුෂ්කරතාවලට මුහුණදීම වෙනුවට අවශ්‍ය භෞතික පහසුකම්, ආහාරපාන සම්පාදනය කරගනිමින් ක්‍රමානුකූලව පිරිස් පොළොන්නරුවට ගෙන්වාගැනීමට කුමරු කටයුතු කළ අන්දම යි.

**පොළොන්නරුවේ අභිෂේක මංගල්‍යය**

ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් වූ පොළොන්නරුව ඉන්ද්‍රපුරය පරිද්දෙන් අලංකාර වූ බව මහාවංසය සඳහන් කරයි. පසු ව අභිෂේක මංගල්‍යය සඳහා පොළොන්නරුවට පැමිණෙන ලෙස බෝසත් විජයබාහු විසින් පියරජතුමාට ආරාධනා කරන ලදී. පුත් කුමරුගේ ආරාධනාව පරිදි පොළොන්නරුවට පැමිණි දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ අභිෂේක මංගල්‍යය සත්දිනක් පවත්වන ලදැයි සඳහන් වේ (පූජාවලිය, 2009:803-804; මහාවංසය ද්විතීය භාගය, 2015:88 පරි. 111-121 ගාථා, 89 පරි. 01-02 ගාථා). මෙම අභිෂේකය සංකේතාත්මකව වැදගත් එකක් බව අමරදාස ලියනගමගේ සඳහන් කරයි. ඊට හේතුව වශයෙන් හෙතෙම සඳහන් කරන්නේ දඹදෙණි රජවරුන්ගේ මූල රාජධානිය වශයෙන්

පොළොන්නරුව සලකන ලද හෙයින් කාලිංග මාඝ පරදවා නැවත වරක් පොළොන්නරුවේ අභිෂේක ලැබීම පරාක්‍රමබාහුගේ ජයග්‍රහණය ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත්කිරීමක් වන බව යි. එසේ ම දඹදෙණියේ රජවරුන් රැඳී සිටිය ද, සිංහල ස්වාධිපත්‍යයේ කේන්ද්‍රස්ථානය වශයෙන් පොළොන්නරුවට ප්‍රමුඛත්වය හිමිව තිබූ බව හෙතෙම වැඩිදුරටත් සඳහන් කරයි (ලියනගමගේ, 1989:250). මෙම සිරිත පොළොන්නරු රාජධානිය ආරම්භ කළ මහා විජයබාහු රජතුමා අතින් ද ඉටු වූ බව වංසකථා අධ්‍යයනයේ දී හඳුනාගත හැකි ය. පොළොන්නරුවේ රාජත්වයට පැමිණිය ද මූල නගරය වූ අනුරාධපුරය ප්‍රතිසංස්කරණ කර වූ රජතුමා එහි මාලිගාවක් කරවා අභිෂේක මංගල්‍යයක් පැවැත් වූ බවට වංසකථාවේ සඳහන් වේ (මහාවංසය ද්විතීය භාගය, 2015:59 පරි. 08-10 ගාථා).

අභිෂේක මංගල්‍යයෙන් පසු ව පෙර සිරිත් ප්‍රකාරව දළදා වහන්සේ සහ පාත්‍රා ධාතුව පොළොන්නරුවේ දළදා මාලිගාවේ තැන්පත් කරවීමට බෝසත් විජයබාහු විසින් කටයුතු කරන ලදී. දඹදෙණියේ සිට පොළොන්නරුව දක්වා මග දෙපස සරසවා මහාසංඝරත්නය සහිත පෙරහැරකින් අලංකාර රථයක වඩා හිඳුවා වැඩම කරවන ලද එම පූජ්‍ය වස්තු උදෙසා මහා පූජා පවත්වන ලදැයි සඳහන් වේ (පූජාවලිය, 2009:803-804; මහාවංසය ද්විතීය භාගය, 2015:89 පරි. 37-41 ගාථා).

**දහස්තොට උපසම්පදා මංගල්‍යය**

අභිෂේක මංගල්‍යයෙන් අනතුරු ව සිදු කරන ලද්දේ පියරජතුමා විසින් පවරන ලද වැඩ ලැයිස්තුවේ අවසන් කාර්යය වූ දහස්තොට උපසම්පදා මංගල්‍යය යි. එහි කටයුතු සංවිධානය කිරීමේ වගකීම පැවරී තිබූ වීරබාහු කුමරු විසින් උපසම්පදා මංගල්‍යයට වැඩම කරන භික්ෂූන් සඳහා අවශ්‍ය ආවාස, දානශාලා සහිත මණ්ඩප ඉදිකරවන ලදැයි සඳහන් වේ. දහස්තොට උපසම්පදා මංගල්‍යය පිළිබඳ ලංකාවාසී සියලු භික්ෂූන්ට දැනුවත් කරන ලද අතර විශාල භික්ෂු සහභාගිත්වයක් යටතේ අඩමසක්

පුරා එය පැවති බව මහාවංසයේ සඳහන් වේ. පූජාවලියේ සඳහන් වන්නේ දෙපෝයක් පුරා උපසම්පදා මංගල්‍යය පැවැති බව යි (පූජාවලිය, 2009:804; මහාවංසය ද්විතීය භාගය, 2015:89 පරි. 47-63 ගාථා). මේ පිළිබඳ ලියනගමගේ සඳහන් කරන්නේ ඒ වන විට සංඝ සමාජය බෙහෙවින් පිරිහී පැවති හෙයින් නියමිත විනය නීති ප්‍රාකාරව උපසම්පදා මංගල්‍යයක් පැවැත්වීම අත්‍යවශ්‍ය කටයුත්තක්ව පැවති බවයි. අනෙක් අතට පැරණි සිරිත් අනුව පවත්වන ලද දහස්තොට උපසම්පදා මංගල්‍යය සඳහා ලංකාව පුරා වැඩසිටි භික්ෂූන් වහන්සේලා සහභාගි වීමත් සමඟ සංඝ සමාජය තුළ ඒකීයත්වයක් වර්ධනය වන්නට ඇත (ලියනගමගේ, 1989:255-256).

උපසම්පදා මංගල්‍යයෙන් පසු ව සුදුසුකම් සපුරන ලද භික්ෂූන්ට ශාසනික තනතුර පිරිනැමීම ශාසනික චිරස්ථිතිය උදෙසා සිදු කරන ලද වැදගත් කටයුත්තක් වශයෙන් හඳුනාගත හැකි ය. ඒ යටතේ මාහිමි, මහා ස්ථවිර, ස්ථවිර සහ ආයතනාධිපති යන තනතුරු සඳහා සුදුසු භික්ෂූන් වහන්සේලා පත් කළ බව සඳහන් වේ. ඉහත මහා පින්කම අවසානයේ ඉතිරිව තිබූ පිරිකර ආදිය සොළී පාණ්ඩ්‍ය රටවල භික්ෂූන් වහන්සේලාට පිටත් කිරීමට ද බෝසත් විජයබාහු විසින් කටයුතු කරනු ලැබ තිබේ (පූජාවලිය, 2009:804; මහාවංසය ද්විතීය භාගය, 2015:89 පරි. 64-70 ගාථා). විදෙස් බෞද්ධ රාජ්‍ය සමඟ ඒ වන විටත් පැවති බෞද්ධාගමික සබඳතා පිළිබඳ මෙයින් අදහසක් ගත හැකි ය.

## සමාලෝචනය

දඹදෙණි රාජධානියේ පාලකයන් අතර බෝසත් විජයබාහු කුමරුට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. බෝසත් ගුණැති අයකු ලෙස කුමරු ප්‍රචලිත ව පැවතිය ද, ඉන් ඔබ්බට ගිය රාජධානියේ ස්ථාවරත්වය උදෙසා සුවිශේෂී වැඩකොටසක් කුමරු අතින් ඉටු වී තිබේ. බෝසත් විජයබාහුගේ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය වශයෙන් හඳුනාගැනෙන මෙම කාර්යය යටතේ රාජධානියේ ආරක්ෂාව තහවුරු කිරීම, හඳුනාගත් වැදගත් ප්‍රදේශවල සංවර්ධන කටයුතු

සිදු කිරීම, වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය ඇතුළු බුදුසසුනට අනුග්‍රහ දැක්වීම සහ අනුරාධපුර හා පොළොන්නරු මූල නගර ප්‍රතිසංස්කරණය කිරීම සිදුව තිබේ. චන්ද්‍රභානු දෙවැනි වර පැරදවීම සිදුවන්නේ ද මෙම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය අතරවාරයේ දී ය.

## ආශ්‍රිත මූලාශ්‍රය


ලියනගමගේ, අමරදාස (2002), *මධ්‍යකාලීන ලංකා ඉතිහාසය*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

*මහාවංසය ද්විතීය භාගය* (2015), සුමංගල හිමි, හික්කඩුවේ හා බටුවන්තුඩාවේ, දොන් අන්ද්‍රියස් ද සිල්වා (සංස්.), ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ.

*පූජාවලිය* (2009), ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (සංස්.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

සුමනජෝති හිමි, දෙගම්මැද (2017), *දඹදෙණි යුගය*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

සුධර්මාවතී, ජේ.ඇම්. (2016), *දඹදෙණිය හා යාපහුව රාජධානි*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

*Epigraphia Zeylanica* Vol. IV (1994), Paranavitana, S. (ed. & tr.), Asian Edcuational Services, New Delhi.